# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1921/6 - 2015 ජුනි මස 29 වැනි සඳුදා - 2015.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/22/65/2009. *නඩු අංකය* : A/3388

### කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.06.10 දිනැති හා අංක 1709/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.06.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කුරුණෑගල, මල්ලවපිටිය, උයන්දන වත්ත, 5 වැනි පටුමග, අංක 259හි පදිංචි අයි. ජී. නිමල් කරුණාතිලක මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.02.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2015 ජුනි මස 22 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය* : IR/22/65/2009.

කාර්මික අධිකරණයේදී ය

අයි. ජී. නිමල් කරුණාතිලක මහතා,
අංක 259, 05 වැනි පටුමග,
උයන්දන වත්ත, මල්ලවපිටිය,
කුරුණෑගල.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

### අතර පැවති කාර්මික ආරවුල පිළිබඳවයි

ප්‍රදානය

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් ප්‍රතිසංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියේ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2011.06.03 වැනි දින මා පත් කොට මා වෙත පවරා ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :-

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකරු (පාලන හා මුදල්) තනතුරෙහි සේවය කරන අයි. ජී. නිමල් කරුණාතිලක මහතා 2009.01.01 දින සිට ක්‍රියාත්මක වන

පරිදි නේවාසික ව්‍යාපාර කළමනාකරු තනතුරට උසස්වීමක් ලබා දෙන ලෙසට ඔහු විසින් කරන ඉල්ලීම යුක්තිසහගතද යන්න හා යුක්තිසහගත නම් ඔහුට කුමන සහනයක් හිමිද, යන්න පිළිබඳව වේ.

01. මෙම කාර්මික ආරවුල, කාර්මික ආරවුල් පනත යටතේ නියමිත 21(i), නියෝග ප්‍රකාරව දෙපාර්ශවයේ සවිස්තරාත්මක ප්‍රකාශ දැක්වීමෙන් අනතුරුව පිළිතුරු ප්‍රකාශ හුවමාරු කරවා ගෙන සමථයක් සඳහා ඉඩ ලබා දුන් පසුව සමථයක් නොමැති බවට වාර්තා කිරීමෙන් අනතුරුව විභාගයට ගන්නා ලදී.

ඉල්ලුම්කාර සේවක පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කරු ද වගඋත්තරකාර සේවා යෝජක පාර්ශවය වෙනුවෙන් පාලන සහකාර පරණාරච්චි පටබැඳිගේ රංජිත් මහතාද සාක්ෂි ලබා දී ඇත. දෙපාර්ශවය තම තමන්ගේ නඩු අවසන් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කාර පාර්ශවය A/01 සිට A/28 දක්වා ද, සේවා යෝජක පාර්ශවය R/01 සිට R/17 දක්වා ද, ලකුණු කරන ලද ලේඛන සමඟ ලිඛිත දේශන ගොනු කොට ඇත.

කාර්මක අධිකරණය හා බේරුම්කරු අධිකරණ බලය අත්පත් කර ගන්නේ, විෂය භාර අමාත්‍යතුමාගේ යොමු කිරීමෙනි.

මෙකී යොමු කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේදී එහි ප්‍රධාන කොටස් දෙකක් හඳුනාගත හැක.

01. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකරු (පාලන හා මුදල්) තනතුරෙහි සේවය කරන අයි. ජී. නිමල් කරුණාතිලක මහතා 2009.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නේවාසික ව්‍යාපාර කළමනාකරු තනතුරට උසස්වීමක් ලබා දෙන ලෙසට ඔහු විසින් කරන ඉල්ලීම යුක්තිසහගත ද,

02. යුක්තිසහගත නම් ඔහුට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳ වේ.

ඒ අනුව -

ඉල්ලුම්කාර සේවක අයි. ජී. නිමල් කරුණාතිලක මහතා වර්ෂ 1985.07.02 දින අභ්‍යන්තර විගණනවරයෙකු වශයෙන් මහවැලි අධිකාරියේ සේවයට එක් වී ඇති අතර, 1988 දී ගණකාධිකාරී III ශ්‍රේණියට ද, 1994.10.01 දින ගණකාධිකාරී II ශ්‍රේණියට ද, 1995.11.25 ගණකාධිකාරී I ශ්‍රේණියට ද, 1999.11.25 වැනි දින ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුරට ද උසස්වීම් ලබා ඇත.

එසේම, වර්ෂ 2005.01.01 දින දේශපාලන පලිගැනීම් කමිටුවේ නිර්දේශය මත නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (පාලන හා මුදල්) තනතුරට පත්ව ඇත. (R/13) එසේම ඉල්ලුම්කාර සේවක පාර්ශවය සමඟ ඉන්දු කුමාරිහාමි මහත්මිය ද නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (පාලන හා මුදල්) තනතුරට උසස්වීම් ලබා ඇත. ඇය 1979.12.15 දින ලිපිකාර ශ්‍රේණියට සමාන්තර ශ්‍රේණියක් වන පොත් තබන්නා III ශ්‍රේණියට ඇතුලත්ව 2001.10.01 ගණකාධිකාරී III ශ්‍රේණියට පත්ව දේශපාලන පලිගැනීම් කමටුවේ නිර්දේශ මත නියෝජ්‍ය නේවාසික කළමනාකාර තනතුරට පත්ව ඇත.

අයි. ජී. නිමල් කරුණාතිලක මහතා කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී විශේෂ උපාධිය සමත් වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මාධ්‍ය (Licentiate) සහ විගණනය සම්බන්ධ වර්ෂ 02ක පුහුණුව සම්පූර්ණ කළ අයෙකු වන අතර, ඉන්දු කුමාරිහාමි මහත්මිය ඉහළම සුදුසුකමක් ලෙස අ. පො. ස. සාමාන්‍ය පෙළ සමත්ව ඇත. පසුව ඇය වික්ටෝරියා කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකර තනතුර පුරප්පාඩු වූ අවස්ථාවේදී 2008.01.01 දින සිට වැඩ බැලීම සඳහා පත් කොට පසුව 2009.01.01 දින ස්ථිර පත්වීම් ලබා දී ඇත.

මෙම තනතුරට අවශ්‍ය සුදුසුකම් ඉල්ලුම්කරු මෙන්ම, වගඋත්තරකරු ද තම ලේඛන මගින් ඉදිරිපත් කර ඇත. (A/05 හා R/01) ඒ අනුව එහි සඳහන් විස්තර මෙසේ ය.

| | |
|---|---|
| තනතුර : | නේවාසික ව්‍යාපාර කළමනාකාර - එල් කලාපය |
| සුදුසුකම් හා පළපුරුද්ද: | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාරවරයෙකු ලෙස අවම වශයෙන් වසර 04ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| | හෝ |
| | පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ සමාන වෘත්තිය සුදුසුකම් සහිත මාණ්ඩලික මට්ටමේ වසර 20ක සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතු අතර, එයින් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. |

සාමාන්‍ය සම්ප්‍රදය වනුයේ යම් තනතුරක් පුරප්පාඩු වූ විට වහාම ඊට පහළ තනතුරේ සිටින අය අතරින් ඉහළම සුදුසුකම් තිබෙන පුද්ගලයා පත් කිරීමයි.

මේ වන විට මෙම සුදුසුකම ඉල්ලුම්කාර සේවක අයි. ජී. නිමල් කරුණාතිලක මහතා සපුරා ඇත. එම නිසා මහවැලි අධිකාරියට සත්‍ය වශයෙන්ම මෙම තනතුරට සුදුසුකම් ලත් පුද්ගලයෙකු පත් කිරීම අවශ්‍ය වූයේ නම් ඒ වන විට සුදුසුකම් ලබා සිටි අයි. ජී. නිමල් කරුණාතිලක මහතා පත් කළ හැකිව තිබුණි. ඔහුට වඩා වැඩි සුදුසුකම් තිබෙන අයෙකු බඳවා ගැනීමට අවශ්‍ය වූණේ නම් (මහවැලි අධිකාරියට පිටතින් හෝ) ඒ සඳහා ඒ අවස්ථාවේදී ඉල්ලුම් පත් කැඳවිය යුතුව තිබිණි. නමුත් එසේ සිදු නොකොට ඒ අවස්ථාවේදී වැඩ බැලීමට ඉන්දු කුමාරිහාමි මහත්මියට අවස්ථාව ලබා දී ඇත. වැඩ බැලීමේ අවස්ථාව ලබා දීමේදී වුව ද, ඒ වන විට එම තනතුරට සුදුසුකම් සපුරා සිටි ඉල්ලුම්කරුට අවස්ථාව සලසා නොදී ඉන්දු කුමාරිහාමි මහත්මියට අවස්ථාව දුන්නේ මන්ද යන්න සඳහා සාක්ෂි ගෙනහැර පෑමට වගඋත්තරකරු ද අපොහොසත් වී ඇත. මෙසේ යම් ව්‍යාකූල තත්ත්වයක් පවතිද්දී ඉන්දු කුමාරිහාමි මහත්මියගේ 2008.05.12 දිනැති ලිපිය මඟින් කරනු ලැබූ ඉල්ලීම මත (A/28) ලිපිය යොමු කල දිනට පසු දින එනම්, 2008.05.13 දිනට විධායක අධ්‍යක්ෂතුමා විසින් ඉන්දු කුමාරිහාමි මහත්මිය නිර්දේශ කරනු ලබයි. මේ දිනය වන විට (R/01 හා A/05) මේ තනතුර දැරීමට සුදුසුකම් කිසිවක් ඇය සතුව නැත. අඩු ම තරමේ සුදුසුකම් තිබෙන කෙනෙකු සිටියදී, ඒ වන විටත් සුදුසුකම් සපුරා නැති අයෙකු නිර්දේශ කරනු ලැබුවේ මන්දැයි ප්‍රශ්නගතව ඇත.

එසේම මෙකී නිර්දේශය ලැබුණේ වුව ද, වගඋත්තකාර මහවැලි අධිකාරිය හොඳාකාරව ඇයට එම තනතුර දැරීමට නොහැකි බව දන්නා නිසා, එක් දිනක් තුළදී නිර්දේශ කලේ වුව ද, තනතුර පිරිනැමීමට ඉක්මන් නොවී තවත් මාස 07ක් ඉන්දු කුමාරිහාමි මහත්මිය සුදුසුකම් සපුරන තෙක් බලා සිට ඇය සුදුසුකම් සපුරනු ලබන්නා වූ දිනට ප්‍රථම දින එනම්, 2008.12.31 දින 2009.01.01 දින සිට ඇය එම තනතුරේ පිහිටිවනු ලබයි. එම අවස්ථාවේදී (2008.12.31 දින) මහවැලි අධිකාරියේ වික්ටෝරියා කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර තනතුර පිරවීමට මහවැලි අධිකාරිය අදහස් කලේ වුව ද, ඊට සුදුසුකම් ලත් පුද්ගලයින් දෙදෙනෙකු සිටින විට කුමක් කළ යුතු ද ?

ඊට ඉල්ලුම්පත් කැඳවිය යුතු නොවේ ද ? ඉල්ලුම්පත් කැඳවීම මහවැලි අධිකාරියට නුපුරුදු නොවී, මන්ද ඊට පසු අවස්ථාවලදී තනතුරු සඳහා පිටස්තර පුද්ගලයින්ගෙන් පවා අයදුම්පත් කැඳවා ඇත. (R/16) පුවත්පත් දැන්වීමද දමා ඇත. (A/06) මේ කිසිදු උපචාරයක් 2008.12.31 වන දින මහවැලි අධිකාරිය අනුගමනය කලේ නැත. එක් දිනක් තුලදී අනුමැතිය ලබා දී පත්වීම දීමට තවත් මාස 07ක් බලා සිටීමට තරම් මහවැලි අධිකාරිය ඉවසිලිමත් වී ඇත. මේ ව්‍යාකූල තත්ත්වය යම් සැකයක් ජනිත කරවයි. මහවැලි අධිකාරිය සත්භාවයෙන් ප්‍රශ්න කරයි.

සත්‍ය ලෙසටම ලංකා මහවැලි අධිකාරියට නියම සුදුස්සා තෝරා ගැනීමට අවශ්‍ය වූයේ නම් පරීක්ෂණයක් (ලිඛිත/වාචික) පැවැත්විය හැකිව තිබුණි. අඩුම තරමින් සම්මුඛ පරීක්ෂණයක් වත් පැවැත්විය හැකිව තිබුණි. සේවා යෝජක වගඋත්තරකරු මෙම නේවාසික ව්‍යාපාර කළමනාකාර තනතුර ඉතා භාරදූර තනතුරක් බවත්, එය ලබා දීමට අයි. ජී. නිමල් කරුණාතිලක මහතාගේ විනය විරෝධී ක්‍රියා කලාපය ප්‍රශ්නයක් බවත්, පෙන්වා ඇත. (R/03 හා R/04 ලේඛන) නමුදු, මෙම ලේඛන 02 පිළිවෙලින් වර්ෂ 2003.04.20 දින හා 2002.11.13 වන දිනයන්හි නිකුත් කරන ලද ලේඛනයන් වන අතර, මෙම ප්‍රශ්න එසේ තිබියදී, වර්ෂ 2005.01.01 දින නියෝජ්‍ය කළමනාකාර පත්වීම ලබා දීමේදී මෙම ලේඛනයක් ප්‍රශ්නයක් වී නැත. මේ අවස්ථාවේදී පමණක් ප්‍රශ්නයක් වීම මහවැලි අධිකාරිය සැබෑ වුවමනාව පිළිබිඹු කරන්නේ ද ?

එසේම සේවා යෝජක වගඋත්තරකරු, ඉල්ලුම්කාර සේවක පාර්ශවයට ලබා දී තිබූ චෝදනා පත්‍රය හා විනය පරීක්ෂණය සම්බන්ධයෙන් දිගින් දිගටම හරස් ප්‍රශ්න අසා ඇති අතර, ඔවුන්ගේ සාක්ෂි මගින් ද, ගෙන හැර දක්වා ඇත. R/05 දරන චෝදනා පත්‍රය 2009.06.17 වේ. ඒ අනුව මෙම චෝදනා පත්‍රය ලබා දී තිබෙන්නේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ තනතුරට අදළ ප්‍රශ්න 2009.01.01 දින උද්ගත වූ පසුවය. එම නිසා ඉතාම තාර්කිකව මෙම චෝදනා පත්‍රය හෝ විනය පරීක්ෂණය මෙම ඉල්ලුම්කාර සේවක පක්ෂයට එකී තනතුර ප්‍රදානය නොකිරීමට කිසිසේත්ම අදළ විය නොහැක.

එසේ R/06 විනය නියෝගය ද R/04 වැඩ බලන ප්‍රධාන අභ්‍යන්තර විගණන තනතුර ඉවත් කිරීමේ ලේඛනය ද, R/015 දරන නේවාසික ව්‍යාපාර කළමනාකරණ තනතුරට වර්ෂ 2011.05.10 දින පැවති සම්මුඛ පරීක්ෂණයේ ලකුණු වාර්තාව ද, මෙම ප්‍රශ්නගත පත්වීම ක්‍රියාත්මක වූ 2009.01.01 දිනට පසුව ඇති වූ සිද්ධීන් වන අතර, යොමුව අනුව මා වෙත යොමු කරන තිබෙන්නේ "2009.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නේවාසික ව්‍යාපාර කළමනාකාර තනතුර ලබා නොදීම" සම්බන්ධිත කාර්මික ආරවුලක් බැවින් ඊට පසුව ඇති වූ සංසිද්ධි සලකා බැලිය යුතු වන්නේ නැත.

2009.01.01 දිනෙන් පසුව පැවති විනය පරීක්ෂණය, විනය නියෝගය සහ තීරු බදු රහිත වාහන බලපත්‍ර ගැටළුව වැනි විනයට අදළ ප්‍රශ්නයන් 2009.01.01 දිනෙන් පසුව ඉල්ලුම්කාර සේවක මහතාට ලබාදිය යුතු සහ ඉල්ලා සිටින උසස්වීමකට අදළ විය හැකි වුවත්, 2009.01.01 දින පුරප්පාඩුව තිබී පුරවනු ලැබූ නේවාසික ව්‍යාපාර කළමනාකරණ තනතුරට අදළ නොවේ.

එසේම තමන් ඊට සුදුසුකම් සපුරා තිබියදී 2008.01.01 සිට නේවාසික ව්‍යාපාර කළමනාකාර තනතුරේ වැඩ බැලීමට සුදුසුකම් නැති නිලධාරියෙකු පත්කර තිබීමෙන් වෙනත් ආකාරයකින් අසාධාරණයක් ඉල්ලුම්කාර සේවක පාර්ශවයට සිදු වී ඇත.

යම් කිසි තනතුරට අදළව අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් කොතරම් තිබුණේ වුව ද, ප්‍රායෝගික තලයේ රාජකාරිය ඉටු කිරීමේ නිපුණතාවය, හැකියාව සහ ආකල්ප සුදුසු නොවන සහ නොගැලපිය හැකිය. නමුදු ඒ සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති ඉල්ලුම්කරුවන්/තරඟකරුවන් අතර මැන බැලීමක් තරඟයක් පැවතිය යුතු ය. එසේ නොවන්නේ නම් වඩා සුදුසු පුද්ගලයා තීරණය කළ නොහැක.

යම් හෙයකින් මෙම ඉල්ලුම්කාර සේවක සහ ඉන්දු කුමාරිහාමි මහත්මිය අතර අඩුතරමින් සම්මුඛ පරීක්ෂණයක් 2009.01.01 දිනට පසුව පැවැතියේ නම්, ඉන්දු කුමාරිහාමි මහත්මිය තේරීමට ඉඩ තිබුණි. නමුදු එසේ සම්මුඛ පරීක්ෂණයක්වත් නොපවත්වා ඉන්දු කුමාරිහාමි මහත්මියට පත්වීම ලබා දීමෙන් මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කාර සේවක පාර්ශවයට අසාධාරණයක් සිදු වී ඇත.

සැමවිටම සාධාරණ සහ යුක්තිසහගත තීරණයක් ලබා දෙන කාර්මික අධිකරණයේ සහ බේරුම්කරණයේ දී ඉල්ලුම්කාර සේවක අයි. ජී. නිමල් කරුණාතිලක මහතාට සිදු වූ අසාධාරණය නිවැරදි කල යුතුව ඇත.

ඒ අනුව-

(අ) 2009.01.01 දින ඉල්ලුම්කරු අයි. ජී. නිමල් කරුණාතිලක මහතාට ලැබිය යුතුව තිබූ අදළ නේවාසික ව්‍යාපාර කළමනාකාර තනතුර 2009.01.01 දින සිට ක්‍රියාත්මක වන ලෙස ලබා දෙන ලෙසටත්,

(ආ) 2009.01.01 දින සිට මේ දක්වා එම තනතුරට හිමි වැටුපේ පිහිටුවා හිඟ වැටුප්, වැටුප් වර්ධක සහ ඊට අදළ සියළු දීමනා ලබා ගත හැකි වන පරිදි මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කල යුතු බවටත් නියෝග කරනු ලැබේ.

මෙම නියෝගය සාධාරණ හා යුක්තිසහගත ප්‍රදානයක් බවට සහතික කරමි. මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ වී මසක් ඇතුළත සිට ක්‍රියාත්මක විය යුතු ය.

බේරුම්කරු,
සුනෙත් ලොකුබෝගහවත්ත.

2015 පෙබරවාරි මස 25 වැනි දින.

07-616

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.